රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/97

මගේඅංකය: 11/950 ඊ/1151/4
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997 පෙබරවාරි මස 03 වැනිදින.

අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ආයතන සංග්‍රහයේ V11 පරිච්ඡේදයේ 12:5:4, 12:6:1 හා**
**1992.12.14 වැනි දිනැති අංක:34/92**
**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**
**සංශෝධනය කිරීම.**

ආයතන සංග්‍රහයේ V11 වැනි පරිච්ඡේදයේ 12:5:4, 12:6:1 උපවගන්ති හා 1992.12.14 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 34/92 පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

"12:5:4 - නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන අතරතුරදී තවත් තවත් නතුරක වැඩ බලන්නේ නම් ඔහුට මෙහි පහත සඳහන් අන්දමට ගෙවිය යුතුය. තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරිය ඉටුකිරීමට, ඔහුට නියමවී ඇත්නම්, ඔහු වැඩ බලන තනතුරට අයත් ආරම්භක වැටුපෙන් 25% ක්ද සමඟ ඔහුගේ නිත්‍ය ත න ත ු ර ට අයත් සම්පූර්ණ පාරිශ්‍රමිකය. තනතුරකට වැටුපක්.නියම කර නොමැති අවස්ථාවලදී 25% කට සමාන වැටුප, කල්පිත වැටුපක් විය යුතු අතර, එය තීරණය කළ. යුත්තේ ඒ සඳහා ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව, භාණ්ඩාගාර ලේකම් ගෙන් විමසා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසිනි."

"12:6:1 - වැඩ බලන නිලධාරියා 12:5:4 වැනි උපවගන්තියේ සඳහන් ගණයට අයත්වන්නේ නම්, ගෙවිය යුතු මුදල, වැඩ බලන තනතුරේ ආරම්භක වැටුපෙන් 25% ක මුදල නොඉක්මවිය යුතුය. "

02. මෙය 1997.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ. වැඩ බලන කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතුය. එම කාලය තුලදී අදළ පුරප්පාඩු නොපුරවන ලද්දේනම් එම තනතුර තවදුරටත් ලබාගැනීමේ අවශ්‍යතාවය අදළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යු.තුය.

03. මේ අනුව ආයතන සංග්‍රහයේ අදළ උපවගන්තිය සංශෝධනය කරනු ලැබේ. මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/ (ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.